# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2025 අංක 16 දරන
## රබර් පාලන (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2025 අගෝස්තු මස 22 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2025 අගෝස්තු මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 20.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2025 අංක 16 දරන රබර් පාලන (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2025 අගෝස්තු මස 22 වන දින]

එල්.ඩී.-ඕ 31/2022

**(436 වන අධිකාරය වූ) රබර් පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2025 අංක 16 දරන රබර් පාලන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

**2.** (1) (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (436 වන අධිකාරය වූ) රබර් පාලන පනත, එහි "පාලක" සහ "රබර් පාලක" යන වචන යෙදෙන සෑම ස්ථානයක ම ඒ වචන වෙනුවට, "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ. — 436 වන අධිකාරයට සිදු කරනු ලබන පොදු සංශෝධනය

(2) වෙනත් යම් ලිඛිත නීතියක හෝ යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක, ආකෘති පත්‍රයක, වෙනත් සාධන පත්‍රයක හෝ ලේඛනයක "පාලක" සහ "රබර් පාලක" සම්බන්ධයෙන් සිදු කරනු ලබන සෑම සඳහන් කිරීමක් ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඊට පසුව "රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා" සම්බන්ධයෙන් සිදු කරනු ලබන සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම්ගනු ලැබිය යුතු ය.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 26 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියෙහි 26 වන වගන්තිය ඉවත් කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි "VI වන කොටස" යන වචන සහ ඉලක්කම්වලට ඉක්බිතිව ම දැක්වෙන ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ:- — ප්‍රධාන ප්‍රඥප්තියෙහි VI වන කොටසෙහි ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම

"රබර් උපදේශක මණ්ඩලය".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 36, 37, 38, 39, 39අ සහ 50 වන වගන්ති ඉවත් කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 36, 37, 38, 39, 39අ සහ 50 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 52 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 52 වන වගන්තිය, එහි "පාලක" යන්නෙහි අර්ථ නිරූපණය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

> "'"අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන්නෙන්, මේ පනත යටතේ පත් කරන ලද හෝ පත් කරන ලද බවට සලකනු ලබන, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදහස් වේ;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.